# බ්‍රිතාන්‍ය යටත් විජිත වාදයට එරෙහිව ඇති වූ අමද්‍යප ව්‍යාපාරය.

කථිකාචාර්ය අජිත් තල්වත්ත

ක්‍රි. පූ. තුන්වන සියවසේ මහින්දාගමනයත් සමඟ ස්ථාපිත වූ මෙරට බෞද්ධ සමාජය බටහිර ජාතීන්ගේ ආගමනයත් සමඟ පුළුල් විපර්යාසයකට භාජනය විය. විශේෂයෙන්ම ක්‍රි. ව. 197. මෙරටට පැමිණි ඉංග්‍රීසීන්ගේ බලපෑම ලංකා සමාජය දෙදරවීමකට ලක් කළේය. සමාජීය අංශයෙන් අවධානය යොමු කරන විට අධිරාජ්‍යවාදී පාලනය මගින් දැඩි පීඩාවක් එල්ල වූ අතර ඉන් මිදීම සඳහා දේශීය ජනතාව විවිධ ක්‍රමෝපායන් භාවිත කළහ. අභියෝගයට මුහුණදීම සඳහා සංවිධානාත්මකව හෝ කණ්ඩායම් වශයෙන් එකතු වී අධිරාජ්‍යවාදී පාලනයට එරෙහිව නැඟී සිටියේය. මෙම අධ්‍යයනය මගින් ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරනු ලබන්නේ බ්‍රිතාන්‍ය පාලන සමයේ දැඩිව ක්‍රියාත්මක වූ මත්පැන් රකුසාට එරෙහිව ජනතාව පෙළ ගැසුණු ආකාරයයි.

යුරෝපීයයන්ගේ පැමිණීමෙන් අනතුරුව ලංකාවට ආවේණික වූ සංස්කෘතිය විනාශවීමේ දොරටු විවර වූ අතර සමස්ත දිවයිනේම බලය තමන් අතට ගෙන බ්‍රිතාන්‍ය පාලන යුගය ඒ අතරින් ද කැපී පෙනේ. ලංකාව තුළ පුරාතනයේ සිටම මත්පැන් පානය, විකිණීම වැනි අංශයක් ක්‍රියාත්මක වුව ද, එය දුරාචාර ක්‍රියාවක් ලෙස වර්ධනය වූයේ බ්‍රිතාන්‍ය පාලන යුගයේදීය. විශේෂයෙන් ක්‍රි. ව. 1833 මෙරට ඇති කළ කෝල්බෲක් කැමරන්

ප්‍රතිසංස්කරණය සමඟ මෙරට සමාජ රටාව නව ආරකට පරිවර්තනය වීම තුළින් මිනිසුන්ගේ සමාජ පැවැත්මෙහි ද නව වර්ධනයක් ඇති විය. මෙරට ඉතිහාසකරණ ක්‍රියාවලිය තුළ මෙම ප්‍රතිසංස්කරණ මගින් නව වර්ධනයක් ඇති වූ බව පෙන්වා දුන්න ද ඇතැම් විට එය සමාජයේ සෑම ක්ෂේත්‍රයකම බිඳවැටීමට ද තුඩුදුන් බව පෙනේ. වතු ආර්ථිකය ඇතිවීමත් සමඟ ලාභය ප්‍රමුඛ වූ බැවින් රජය සෑම අයුරකින්ම මුදල් උත්පාදනය කිරීම සඳහා යොමු විය. ඒ අනුව මුදල් ඉපයිය හැකි පහසු මඟක් ලෙස මත්පැන් ලංකා සමාජයට ආදේශ කළේය. මුදල් සංසරණය ඉහළ යෑම තුළින් සුරාසැල් ව්‍යාප්ත කළ අතර ඒ සඳහා දේශීය ව්‍යාපාරිකයින් ද මුදල් ආයෝජනය කළහ. මත්පැන් පානය කිරීම නිසා සමාජය තුළ නොයෙකුත් ගැටලු සහ අර්බුද ඇති වීමට ඉවහල් වූ අතර ඒ තුළින් සමාජ සංස්ථාව බිඳ වැටීමේ සලකුණු ඇති විය. එවැනි අවස්ථාවක් තුළ මෙරට ජනතාව ඒකරාශීව ක්‍රියාත්මක කළ ව්‍යාපාරයක් ලෙස "අමද්‍යප ව්‍යාපාරය" සඳහන් කළ හැකිය.

19 වන සියවසෙහි දිවයින පුරා සුරාසැල් ව්‍යාප්ත වනවිට ස්වදේශිකයන් මත්පැන් පානයෙන් ගලවා ගැනීමේ ප්‍රචාරක ව්‍යාපාරයන් ද ආරම්භ වූ බව පෙනේ. සමකාලීනව ක්‍රියාත්මක වූ බෞද්ධ පුනරුද ව්‍යාපාරයට නායකත්වය ලබාදුන් භික්ෂූන් වහන්සේලා, ගිහි නායකයින් ද එබඳු ප්‍රචාරක කටයුතුවල නිරත වූහ. අනගාරික ධර්මපාල තුමාගේ දේශන, සිංහල බෞද්ධයා පුවත්පත මගින් ද, පියදාස සිරිසේන මහතාගේ ප්‍රබන්ධ කතා සහ සිංහල ජාතික පුවත්පත මගින් ද, ජෝන් ද සිල්වාගේ නාට්‍ය මගින් ද, මත්පැන් පානයට එරෙහි විශාල විරෝධතා ව්‍යාපාරයක් ගෙන ගියහ. හුදෙක් මෙම ව්‍යාපාර මගින් සිදු වූයේ රජයේ සුරාබදු ප්‍රතිපත්තියට එරෙහි ජනතාව සංවිධානය කිරීමට වඩා මත්පැන් පානයේ ඇති වූ විපාක ජනතාවට අවබෝධ කරවීමයි.

මෙම අවධියේ ඇති වූ සමාජ ව්‍යාපාර, සංස්කෘතික ව්‍යාපාර හා දේශපාලන ව්‍යාපාර තිබුණි. මෙම ව්‍යාපාරයන්හි නොයෙක් ආකාරයේ ජනතාවගේ අපේක්ෂාවන් ඒකරාශීව තිබුණි. විශේෂයෙන්ම අමද්‍යප ව්‍යාපාරය පිළිබඳ ඇතැම් විචාරකයින්ගේ මතය වන්නේ

බෞද්ධ ජාතික නැගීම ඉස්මතු කළ ව්‍යාපාරයක් වශයෙනි. මෙම ව්‍යාපාරය අදියර දෙකක් යටතේ ක්‍රියාත්මක විය. එනම්, 1903-1905 පළමු අවස්ථාව ලෙසත්, 1911- 1915 දෙවන අවස්ථාව ලෙසත්, පෙන්විය හැකිය. මෙම ව්‍යාපාර දෙක අතර කිට්ටු සම්බන්ධතාවක් සහ පරතරයක් දක්නට ලැබේ. පළමු අමද්‍යප ව්‍යාපාරය සාමාන්‍ය ජනතාවගෙන් සමන්විත වන අතර එහි නායකත්වය ගන්නේ සාමාන්‍ය ජනතාවයි. මුල් අවස්ථාවේ ප්‍රභූ නායකයින් සිටිය ද වඩාත් කැපී පෙනුණේ සාමාන්‍ය ජනතාවයි. මෙම ව්‍යාපාරය මූලික වශයෙන් ඇති වන්නේ සාමාන්‍ය ජනතාව තුළ බ්‍රිතාන්‍ය පාලනය යටතේ ඇතිවන යම් යම් වර්ධනයන් මගින් ජනිත කළ ප්‍රතිඵලය කෙරෙහි ඇති වූ බිය නිසාය. විශේෂයෙන්ම ආර්ථික වාණිජකරණයත්, මුදල් පරිභරණය වැනි දේ නිසා සාමාන්‍ය ජනතාව තුළ පීඩනය සහ බිය ජනිත වී වැඩි වැඩියෙන් මුදල් අත්‍යවශ්‍ය විය. ග්‍රාමීය මට්ටමේ පරිභරණයට ලක්වන ද්‍රව්‍යවල මිල ඉහළ යාම, අඩුවෙන් භාණ්ඩ පරිභරණය කිරීම සහ නොයෙකුත් ආකාරයෙන් මෙම සමාජයෙහි අනාගතය ගැන බියක් ඇති වේ. මෙම හැඟීම ග්‍රාමීය සමාජය තුළ ලැගුම් ගනී. ඇතැම් ගැමියන් වතු කම්කරුවන් බවට පත් වී සේවය කිරීමට සිදු වේ. ඉන් ස්ථාවර ජීවිතයක් ඇති නොවන අතර මුදල්වල අවශ්‍යතාවය වඩාත් ඉස්මතු වේ. ගොවිතැන් කිරීමට අවශ්‍ය ඉඩම්වල සීමිත භාවයක් තිබුණි.

මෙම අවධියේ දී කාර්මික රටවලින් ගෙන් වූ භාණ්ඩ වැඩි වැඩියෙන් පරිභරණයට ජනතාව පෙලඹීමක් දක්නට ලැබේ. උදාහරණයක් ලෙස භාණ්ඩ වෙනුවට ඇළුමිනියම් භාණ්ඩ භාවිතයත්, ලාම්පු, සබන් භාවිතය වැනි සාමාන්‍ය ජීවිතයේ පරිභරණය කළ දේට වඩා නව භාණ්ඩ කෙරෙහි වඩ වඩාත් අවධානය වැඩි විය. මෙම කටයුතු සියල්ල කිරීමට මුදල් අවශ්‍ය වුව ද ධනය උපයා ගත හැකි ක්‍රම නොවූ බැවින් ග්‍රාමීය සමාජය කඩා වැටීමක් දක්නට ඇත. මෙම පසුබිම තුළ මත්පැන් උවදුර පිළිබඳ භීතිකාව ගම ආක්‍රමණය කළේය. ඒ අනුව සුළු වශයෙන් පැවති ඒවා පුළුල් ආකාරයේ ව්‍යාපාර බවට පත් වේ. සමාජ ප්‍රශ්න හමුවේ ජනතාව මත්පැන් පානය සඳහා ලොල් වූ පිරිසක් බවට පත් වී විශාල අර්බුදයක් බවට ග්‍රාමීය සමාජය පත් වූ බව පෙනේ.

සමාජ ප්‍රශ්න දිනෙන් දින ඉහළ යන අතර එයට පිළියම් යෙදීමට යටත් විජිත පාලකයන්ට නොහැකි වූහ. ඔවුන් ලබාදුන් එකම පිළිතුර වූයේ මත්පැන්ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මෙම අවධියේ දී සුරා යකා, සුරා බලිය ආදී ලෙස පොත්පත්වල වර්ධනයක් ද ඇත.

මත් වැටිය භාවිතයට එරෙහිව නොයන ව්‍යාපාර මෙම අවධියේ පැවතිනි. සුචරිත වර්ධන සභාව ඉන් එකකි. මේවාට නායකයින් පත් කරනු ලබන්නේ ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේගේ මූලිකත්වය මතය. ගැමියාගේ ස්වයං පාලනය මගින් මත්පැන් නොබී සිටීමේ ව්‍යාපාරයක් ග්‍රාමීය සාමාන්‍ය ජනතාව ආරම්භ කරන ලදී. ජනතාව මත්පැන් ප්‍රතික්ෂේප කිරීමත් සමග ගම්වල තැබෑරුම් වැසීමට අධිරාජ්‍යවාදීන්ට සිදු විය.

ප්‍රභූ නායකත්වය බෞද්ධ පුනර්ජීවනය හරහා අධිරාජ්‍ය විරෝධී ව්‍යාපාරයට සම්බන්ධ කර ගැනීමට නොහැකි වේ. එසේ කිරීමට නම් බටහිරකරණයට ලක් වූ ප්‍රභූ නායකත්වයක් අවශ්‍ය විය. ඇතැම් ප්‍රභූ නායකයින් මීට සම්බන්ධ වී කටයුතු කළත් ප්‍රභූ පන්තිය ඉදිරිපත් නොවේ. මෙම ව්‍යාපාරයට සහාය දීමට නොහැකි තත්ත්වයක් උද්ගත වේ. ඊට හේතු වූයේ පුද්ගලික නිදහස පිළිබඳ ප්‍රශ්නයකි. ඒ වන විට ලංකාවේ ධනේෂ්වර පන්තිය වූයේ රේන්දකරුවන්ය. මෙම පිරිස අරක්කු නිෂ්පාදනය සහ විකිණීමෙහි නිරත වූ බැවින් මෙම ව්‍යාපාරයට සහාය දීමට නොහැකි වන්නට ඇත.

ප්‍රථම අමද්‍යප ව්‍යාපාරය සඳහා ග්‍රාමීය නායකත්වය ලබා දුන්නේ කොග්ගල පී. එ. ද සිල්වා විසිනි. මෙම ව්‍යාපාරය දකුණ, බස්නාහිර, වයඹ හා සබරගමුව යනාදී පළාත් කිහිපයකම පැතිර ගියේය. ඒ වගේම එය වඩාත් ජනප්‍රිය වූයේ බෞද්ධ ජනතාව තුළ පමණි. එහි ක්‍රියාකාරී අවධිය වසර දෙකකට සීමා වුවත් පුළුල් වශයෙන් රටපුරා ව්‍යාප්ත වූයේ දෙවන අදියරේ සිටය.

පළමු අමද්‍යප වයාපාරය පුළුල් සමාජ ස්වරූපයක් ගත්තේය. නමුත්, මේ සඳහා ප්‍රභූ කොටස්වල සහයෝගය හිමි වූයේ නැත. එනිසා එය පරිහානිය කරා ගමන් කළේය. මෙම අවස්ථාවේ දී ප්‍රභූන් එම ව්‍යාපාරය කෙරෙහි දක් වූ ආකල්පය

ඉතා වැදගත් වේ. 1903 බෞද්ධ පරමවිඥාර්ථ සංගමයේ පුරෝගාමීන් වශයෙන් කැඳවනු ලැබූ අය අමද්‍යප ව්‍යාපාරයට සහාය දීම නිදහස සීමා කිරීමක් ලෙස සලකා අනුග්‍රහය දැක්වීමෙන් ඉවත් වූහ. ඒ තුළින් අවබෝධ වන්නේ බෞද්ධ ප්‍රභූන්ගේ සමාජ ආකල්පය මෙවැනි පුළුල් ව්‍යාපාරයකට අනුබලයක් වූයේ නැත. සාමාන්‍ය ප්‍රභූන් සෙසු ජනතාව මෙන් කල්පනා කළේ සාමාන්‍ය සමාජයේ ආර්ථික සමාජමය හා බුද්ධිමය තත්ත්වයේ ප්‍රමාණවත් වර්ධනයක් ඇතිවන තුරු දේශපාලන කටයුතු සඳහා සාමාන්‍ය සමාජය මෙහෙයවීම යෝග්‍ය නොවන බවයි. සාමාන්‍ය ජනතාව දෙස අවධානය යොමු කළේ නොදියුණු නූගත් පිරිසක් ලෙසය. ඒ වාගේම මෙම කාලයේ ප්‍රවෘත්ති පත්‍ර වන දිනමිණ, සරසවි, සඳරැස් ආදිය මගින් බෞද්ධ නායකයින් හා සාමාන්‍ය ජනතාව අතර පරතරයක් ඇති බව පෙන්වා ඇත. ඉන් හැඟී ගියේ බෞද්ධ නායකයින් ස්වකීය අපේක්ෂා ඉටුකර ගැනීමට ක්‍රියා කළා මිස බෞද්ධ සමාජයේ අභිවෘද්ධිය සඳහා කටයුතු නොකළ බවකි. බෞද්ධ පුනර්ජීවන ව්‍යාපාරය තුළින් ඉදිරියට පැමිණි ජනතාව තුළ තව දුරටත් ගැටුම් තිබුණ බව පෙනේ. එසේ පැවසීමට හේතු වූයේ ව්‍යවස්ථාදායක සභාවේ බෞද්ධ නියෝජිතයකු සිටිය යුතු යැයි ඉදිරිපත් කළ යෝජනාව තුළ නොයෙකුත් මතගැටුම් හට ගත් නිසාය.

1912- 1915 අතර කාලයේ වර්ධනය වූ දෙවන අමද්‍යප ව්‍යාපාරයේ ආගමික හා සංස්කෘතික කටයුතු පමණක් නොව දේශපාලන කටයුතු ද සාකච්ඡාවට ලක් වූ හෙයින් එය ජාතික නිදහස් ව්‍යාපාරයෙහි වැදගත් අවස්ථාවක් වශයෙන් සැලකිය හැකිය. මුල් ව්‍යාපාරය ග්‍රාමීය මට්ටමෙන් වුව ද, දෙවන අදියර හාත්පසින්ම වෙනස් ආකාරයකට වර්ධනය විය. මෙම අවධිය වන විට රජය උපරිම ලෙස මත්පැන් විකිණීමෙන් ඉහළ ආදායමක් ලබා ගනී. ඒ සඳහා රජය ගනු ලැබූ පියවර වූයේ තැබෑරුම් ප්‍රමාණය වැඩි කිරීමයි. ඒ අනුව අරක්කු තැබෑරුම්, රා තැබෑරුම් ඇති කිරීමට පියවර ගනී. 1912 ආණ්ඩුව නව සුරාබදු පනතක් පැනවීම හේතුකොට ගෙන රටපුරා මත්පැන් අලෙවිය වඩාත් වේගවත් වූ බව පෙනේ.

රා තැබෑරුම් වැඩි කිරීම නිසා පැවති රේන්ද ක්‍රමය මගින් අරක්කු වෙළඳාම් කරන්නාට රා ද විකිණීමට අවස්ථාව උදාවිය. රා සහ අරක්කු විකිණීමේ අයිතිය රේන්ද මගින් ලබාදුන් අතර අවුරුද්ද පුරා තැබෑරුම්වල රා විකිණීමේ ඉඩ ප්‍රස්තාව උදා වූ බව පෙනේ. මත්පැන් පිළිබඳ ආධිපත්‍යය රේන්දකරුවාට හිමිවිය. ඔහු කිසිදිනක රජයට නිවැරදි දත්ත ලබා නොදෙන අතර රජයේ ආදායම වැඩිකර ගැනීමේ අරමුණින් තැබෑරුම් ප්‍රමාණය ගම් ආශ්‍රිතව පුළුල් කළේය. සෑම ගමකටම රා තැබෑරුමක් සහ සුළු නගරවලට අරක්කු තැබෑරුම බැගින් පිහිටුවන ලදී. මෙම පසුබිම තුළ අරක්කු රේන්දකරුවාට අංශ දෙකක් යටතේ පහර වැදිනි. එනම්, රේන්දයේ වටිනාකම අඩුකර ගැනීමට නොහැකි වීමත්, රේන්දකරුවන් රා විකිණීමේ අඩුවක් ද දක්නට ලැබුණි. මේ තුළින් අරක්කු නිෂ්පාදනය කරන ස්කාගාර හිමියන්ට ද පහර වැදී ඇත. මෙම ක්‍රියාදාමය නිසා රා මදින අයගේ සිට විකුණන පුද්ගලයා දක්වා දැඩි පීඩනයක් එල්ල විය. මෙම තත්ත්වය තුළ සමාජයේ නොයෙක් උද්ඝෝෂණයක් හට ගත්තේය. මෙම අවධියේ සාමාන්‍ය ජනතාවගේ අදහස වූයේ තැබෑරුම් වසා මත්පැන් පානය තුරන් කිරීමයි. එනමුත් එයින් සිදු වූයේ නව තැබෑරුම් තව තවත් ආරම්භ කිරීමයි. සැබෑ අමද්‍යප ව්‍යාපාරයෙන් අපේක්ෂා කරන්නේ මත් පැන් පානය නැති කිරීම වුව ද මෙම අවස්ථාවේ එවැනි ආකල්පයක් නොවීය. විශාල පිරිසකගේ දායකත්වය මේ වන විට හිමිව තිබුණි. මෙය මිනිරන් පතල්කරුවන් සහ ව්‍යාපාරිකයන්ට ද තදින් බලපාන ලදී. එයට හේතු වූයේ කම්කරුවන් මත්පැන් පානය කර සේවයට පැමිණීම නිසා උපරිම සේවයක් ලබා ගැනීමට නොහැකි වීමයි.

මෙම කාලයේ බෞද්ධයන්ගෙන් එල්ලවන චෝදනාවන් වන්නේ ක්‍රිස්තියානි ආගම මගින් මත්පැන් පානය සඳහා අනුබල දෙන බවකි. එනම් සත්ප්‍රසාදය පිණිස වයින් යොදා ගැනීමත් සමඟ වයින් පානය කිරීම ආගමික වශයෙන් තහනම් නැත. දේශීය ප්‍රභූ පන්තිය සිය ආර්ථික අපේක්ෂාවන් ඉටුකර ගැනීමට (ජේම්ස් පීරිස් සහ මාක්ස් ප්‍රනාන්දු) මත්පැන් ආශ්‍රිත ව්‍යාපාරයෙහි නිරත විය. දේශීය ප්‍රභූ පන්තියේ ආකල්පය බලන විට මාක්ස් ප්‍රනාන්දුගේ මතය වූයේ රා බීම හෙළා දකින අතර අරක්කු බීම අනුමත කිරීමයි.

1912 ආරම්භ වූ අමද්‍යප ව්‍යාපාරයේ විශේෂ ලක්ෂණයක් වූයේ උගත් මධ්‍යම පන්තිකයන්ගේ නායකත්වයෙන් පැන නැගුණක් වීමයි. 1910 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ මගින් තම අපේක්ෂාවන් ඉටු නොවීමත් මෙම යුගය වන විට ජීවන වියදම ඉහළ යාම සහ ආණ්ඩුවේ වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශ මත මෙරට සිටි බ්‍රිතාන්‍ය නිලධාරීන්ගේ වැටුප් වැඩි කිරීමට සාපේක්ෂව දේශීය නිලධාරීන්ගේ ප්‍රමාණවත් වැටුපක් වැඩි නොකිරීමත්, මධ්‍යම පන්තික උගතුන්ගේ කනස්සල්ලට හේතු වූ බව පෙනේ. අමද්‍යප ව්‍යාපාරය දේශපාලන ව්‍යාපාරයක් නොවූ නිසා ආණ්ඩු විරෝධී චෝදනාවට ඉලක්ක නොවීය. එමගින් සිය දේශපාලන ප්‍රචාරයන් ගෙනයාමට ද ඔවුන්ට හැකි විය. මධ්‍යම පන්තික පිරිස අමද්‍යප ව්‍යාපාරයට ඒකරාශී වීම තුළින් එතෙක් ජාතික පුනර්ජීවන ව්‍යාපාරය සහ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය වශයෙන් මාර්ග දෙකක ගමන් කළ මෙරට නිදහස් ව්‍යාපාරයේ කටයුතු ටික කලකට පෙර සම්මිශ්‍රණ විය.

ප්‍රභූ නායකත්වයේ ආකල්පය ඉහත දැක් වූ පදනම මත තිබුණ ද 1913 දී බෞද්ධයින් විසින් වෙනම අමද්‍යප ව්‍යාපාරයක් පටන් ගනී. මේ සඳහා නායකත්වය දෙනු ලබන්නේ ඩී. එස්. සේනානායක, ඩී. එස්. ද සිල්වා, ඩී. බී. ජයතිලක වැනි අය යි. මෙම ව්‍යාපාරය තුළින් සියලු තැබෑරුම් වැසීමට කටයුතු කෙරිණි. මේ තුළින් බෞද්ධ හා ක්‍රිස්තියානි ගැටීමක් ඇති වූ බව පෙනේ.

අමද්‍යප ව්‍යාපාරයේ කටයුතු පුළුල් වීමත් සමඟ ඊට එරෙහිව උද්ඝෝෂණ රටපුරා පවත්වන ලදී. ප්‍රථමයෙන් 1912 මැයි 21 දින කොළඹින් ආරම්භ වූ මෙම රැස්වීම් ව්‍යාපාරය පසුව නුවර එළිය, අලුත්ගම, මීරිගම, කළුතර, හලාවත, හැටන්, තංගල්ල වැනි නගරවලට ද ව්‍යාප්ත විය. උද්ඝෝෂණ ව්‍යාපාරය පුළුල්වත්ම උගතුන් පමණක් නොව පහතරට නිෂ්පාදන සංගමයත්, මිනිරන් වෙළෙඳුන්ගේ සංගමයත්, ආණ්ඩුවේ සුරාබද්ද ප්‍රතිපත්තියට එරෙහිව යටත් විජිත කාර්යාලයට පෙත්සම් යැවූහ. මධ්‍යම පන්තිකයන්ගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටි මෙම සංවිධාන මීට පෙර පොදු ජනතාව වෙනුවෙන් හඬ නැඟීමට වැඩි කැමැත්තක් නොදැක්වීය.

එසේ පොදු ජනතාවගෙන් දුරස් වී සිටි ධනවතුන් රජයේ ප්‍රතිපත්තියකට විරුද්ධව ජනමතයක් ගොඩනැගීමට ඉදිරිපත්වීම අමද්‍යප ව්‍යාපාරයේ වැදගත් ලක්ෂණයකි.

මෙම ව්‍යාපාරයේ සංවිධාන ජාලය ගොඩනැගී තිබුණේ රටේ සියලු ප්‍රදේශ ආවරණය වන ලෙසය. ග්‍රාමීය හා ප්‍රාදේශීය අමද්‍යප සභා දිස්ත්‍රික් අමද්‍යප සභාව යටතේ ක්‍රියාත්මක විය. දිස්ත්‍රික් සහ ප්‍රාදේශීය අමද්‍යප සමිතිවලින් පැමිණි පිරිස මද්‍යම අමද්‍යප සභාවට සහභාගී විය. 1915 පමණ වනවිට මධයම අමද්‍යප සභාවට එකරාශී වූ පිරිස 5000 ක් පමණ වූ බව පෙනේ. මෙම ව්‍යාපාරයේ සාර්ථකත්වය වූයේ පුළුල් ජනතා සහභාගිත්වයක් ලබා ගැනීමට හැකිවීමයි. තව ද, මෙම ව්‍යාපාරය හේතුකොට ගෙන ගැමි ජනතාව සහ මධ්‍යම පන්තිය අතර කිසියම් සමීප සම්බන්ධතාවයක් ගොඩනැගුණේය. එපමණක් නොව මෙම ව්‍යාපාරයට සම්බන්ධ වූ පුද්ගලයින්ට පසු කාලයේ ශ්‍රී ලංකා දේශපාලනයේ ජාතික නායකයින් වීමට ද අවශ්‍ය පසුබිම නිර්මාණය වූ බව පෙනේ.

අමද්‍යප ව්‍යාපාරයේ සාර්ථකත්වය මෙරට නිදහස් ව්‍යාපාරයේ ගමන් මඟ ප්‍රබෝධමත් කිරීමට ද මහෝපකාරී විය. යටත් විජිත ආණ්ඩුව ඍජුව විවේචනය කිරීමෙන් විශාල ජනතාවක් අමද්‍යප ව්‍යාපාරය වෙත සහභාගී වීමත් නිසා ආණ්ඩුවේ ඉදිරි පැවැත්මට තර්ජනයක් වන බව අවබෝධ කරගත්තේය. අනතුරුව එය මර්ධනය කිරීම කෙසේ කළ යුතු දැයි සැලසුම් කරන අතර 1915 ඇති වූ සිංහල, මුස්ලිම් කෝලාහලය ඊට ප්‍රවේශයක් කර ගන්නා ලදී. ඒ අනුව අමද්‍යප ප්‍රචාරක කටයුතු කළ පුවත්පත් තහනම් කර ක්‍රියාකාරී නායකයින් අත් අඩංගුවට ගෙන සිරකර තබා ව්‍යාපාරය අඩපණ කිරීමට පියවර ගෙන තිබේ.

කෙසේ වුව ද, අමද්‍යප ව්‍යාපාරයේ තවත් සාර්ථක අංශයක් වූයේ ජාතීන් අතර පැවති කුල භේදය තුරන් කිරීමට ද එය හේතු වීමයි. ලාංකිකයන් වශයෙන් එකට එක් වී කටයුතු කිරීමේ වැදගත්කම මෙමෙ ව්‍යාපාරය මගින් පෙන්වා දුන්නේය. ලංකා මාතාවගේ අභිවෘද්ධියට හේතුවන දේශප්‍රේමීත්වය ජාතිය තුළ ඉස්මතු කිරීමට අමද්‍යප ව්‍යාපාරයට හැකි විය. අමද්‍යප

උද්ඝෝෂණය නිසා මෙකල පළ වූ සිංහල පුවත්පත් ද, ලාංකීය ජනතාව අතර ජාතියක් වශයෙන් නියෝජනය කිරීම පිණිස ජාතික කොඩිය, ජාතික ගීය නිර්මාණය කරගැනීමේ වැදගත්කම පෙන්වා ඇත. කෙසේ වුවත් මෙරට තරුණ පරපුර තුළ නිදහස් රාජ්‍යයක වාසය කිරීමට ජාතික ව්‍යාපාරයට අවශ්‍යය සිතිවිලි වර්ධනය කිරීමට ජාතික ව්‍යාපාරයට හැකි විය.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය.**


01. අභයසිංහ ටිකිරි, දේවරාජ ශ්‍රීමත්, සෝමරත්න ජී. පී. වී. උඩරට රාජධානිය, කොළඹ, සීමාසහිත ලේක්හවුස් සමාගම, 1977.

02. විමලරත්න කේ. ඩී. ජී. ලංකාවේ බ්‍රිතාන්‍ය ආධිපත්‍යය, කොළඹ, 1994.

03. ප්‍රඥාසේකර, කළුකොඳයාවේ, සිංහල පුවත්පත් සඟරා ඉතිහාසය, කොළඹ, 1965.

04. ජයවර්ධන විශාකා කුමාරි, ප්‍රේමලාල් කුමාරසිරි, (පරි) ශ්‍රී ලංකාවේ කම්කරු ව්‍යාපාරයේ නැගීම, සංජීව ප්‍රකාශන, 1989.

05. මිරැන්ඩෝ ඒ. එම්, 17, 18 සියවසෙහි සිංහල සාහිත්‍යය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2002.

06. රත්නපාල හැවැන්පොල, බ්‍රිතාන්‍ය ප්‍රතිපත්ති, බුද්ධසමය හා පිරිවෙන් අධ්‍යාපනය, කැලණිය,1970.

07. සිරි තිලකසිරි, 19 වන සියවසේ ශ්‍රී ලංකාවේ ජාතික ආගමික අරගල, ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ, 2000.

09. University of Ceylon, History of Ceylon. K. M. de Silva, ed viii, Colombo, 1973

10. Malalgoda, Kithsiri, Buddhism in Sinhala Society 1750- 1900, University of Calofornia, 1975.

11. Jayasekera, P.V.T, Temperance and National is in Sri Lanka, Kalaniya, 1984- 85

12. Fernando, Tissa, Arrack Today and Ceylonese Nationalism, some Observation of the Temperance Movements, Ceylon Studies seminar. 1969- 70